## මූලික පිරිවෙන් අවසාන විභාගය (නව නිර්දේශය) - මූලාකෘති ප්‍රශ්න පත්‍රය

### (03) ත්‍රිපිටක ධර්මය

### පිළිතුරු පත්‍රය
### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර අංකය |
|---|---|
| **1** | 4 |
| **2** | 2 |
| **3** | 1 |
| **4** | 2 |
| **5** | 3 |
| **6** | 3 |
| **7** | 2 |
| **8** | 4 |
| **9** | 3 |
| **10** | 1 |
| **11** | 2 |
| **12** | 4 |
| **13** | 3 |
| **14** | 2 |
| **15** | 4 |
| **16** | 2 |
| **17** | 3 |
| **18** | 1 |
| **19** | 4 |
| **20** | 2 |

| ප්‍රශ්න අංකය | පිළිතුර අංකය |
|---|---|
| **21** | 2 |
| **22** | 4 |
| **23** | 2 |
| **24** | 1 |
| **25** | 4 |
| **26** | 1 |
| **27** | 2 |
| **28** | 2 |
| **29** | 1 |
| **30** | 3 |
| **31** | 2 |
| **32** | 4 |
| **33** | 3 |
| **34** | 1 |
| **35** | 3 |
| **36** | 2 |
| **37** | 3 |
| **38** | 4 |
| **39** | 2 |
| **40** | 1 |

ලකුණු $1 \times 40 = 40$

# (03) ත්‍රිපිටක ධර්මය

## II පත්‍රය

## පිළිතුරු සඳහා මඟ පෙන්වීම

### I කොටස

**01.** **(i)** සම්මා සම්බුද්ධ

**(ii)** මව්කුස හටගන්නා බැවින්, ගබ්භසෙය්‍යක නම් වේ. අණ්ඩජ ජලාබුජ යන දෙකොටසම මෙයට අයත් වේ.

**(iii)** දම්සක් පැවතුම් සූත්‍රයේ අංග 08කින් විග්‍රහ කෙරෙන දුක්ඛ ආර්ය සත්‍යය මජ්ඣිමනිකායේ සච්ච විභංග සූත්‍රයේ දී අංක 10කින් විග්‍රහ වේ.

**(iv)** පාරාජික, සංඝාදිසේස, පාචිත්තිය, පාටිදේසනීය

**(v)** මහාකාශ්‍යප මහරහතන් වහන්සේ

**(vi)** ධම්මානුපස්සනා

**(vii)** රජතුමා දැහැමි අයෙකු වුවහොත් සමස්ත රටවැසියෝ සැපවත් වෙති.

**(viii)** පට්ඨානප්පකරණය

**(ix)** පුබ්බකරණ, පුබ්බකිච්ච

**(x)** සබ්බ චිත්ත සාධාරණ, පකිණ්ණක

### II කොටස

**02.** (i) සුනීත සැඬොල් පුතු/ දෙව්ලොව උපන් සැඬොල් ස්ත්‍රිය/ මලකඳක බැඳ සිටි සෝපාක/ භද්‍රවතිකා ඇතින්න/ බණ ඇසීමට ගොස් ආහාර ලැබූ දුප්පතා/ සෝවාන් වූ පේසකාර දුව/ රජ්ජුමාලා මෙහෙකාරිය/ තිස්ස භික්ෂුව/ උදරාබාධයෙන් පෙළුණු භික්ෂුව **(ලකුණු 02යි)**

(ii)
- සුනීත සැඬොල් පුතු - සුනීත ශාසනයට ඇතුළත් කර ගැනීමේ කථා පුවත ලියා තිබීම
- දෙව්ලොව උපන් සැඬොල් ස්ත්‍රිය - බුදුරදුන් කෙරෙහි සිත පහදවා ගත් සැඬොල් ස්ත්‍රිය ගව දෙනක ඇනීමෙන් මරණයට පත්වීම ඇතුළත් කථා පුවත ලියා තිබීම
- මලකඳක බැඳ සිටි සෝපාක - මළ සිරුරක් ඇඟට තබා බැඳ අමු සොහොනේ තනි කොට සිටි සෝපාක ශාසනයට ඇතුළත් කර උපසම්පදාව ලැබීමේ කථා පුවත ලියා තිබීම
- භද්‍රවතිකා ඇතින්න - ගතයුතු වැඩ ගෙන වයසට ගිය පසු නොසලකා හැරී මහලු භද්‍රවතිකා ඇතින්නට නැවත රාජ්‍ය ගෞරව ලබා දීම ඇතුළත් කථා පුවත ලියා තිබීම
- බණ ඇසීමට ගොස් ආහාර ලැබූ දුප්පතා - නැති වූ තම ගවයන් සොයාගෙන කුසගින්නේම බණ ඇසුමට ගොස් සිටි දුප්පතාට ආහාර ලැබීම හා ඔහු සෝවාන් වීම ඇතුළත් කථා පුවත ලියා තිබීම
- සෝවාන් වූ පේසකාර දුව - මරණානුස්මෘතිය වැඩූ අලව්නුවර පේසකාර දියණිය බණ අසා සෝවාන් වීමේ පුවත ඇතුළත් කථා පුවත ලියා තිබීම
- රජ්ජුමාලා මෙහෙකාරිය - ගයා පෙදෙසේ මෙහෙකාරියක වූ මාලා ස්වාමිදුවගේ තාඩන, පීඩන ඉවසාගත නොහැකිව සියදිවි නසා ගැනීමට සූදානම් වූ මොහොතේ බුදුබණ අසා සෝවාන් වීමේ පුවත ඇතුළත් කථා පුවත ලියා තිබීම

- තිස්ස භික්ෂුව - ජේතවනාරාමයේ වැඩ සිටි කුෂ්ට රෝගයෙන් පෙළුණු තිස්ස භික්ෂූන්වහන්සේ පූතිගත්ත තිස්ස වීම නිසා හා බුදුබණ අසා රහත් වීම යන කථා පුවත ලියා තිබීම
- උදරාබාධයෙන් පෙළුණු භික්ෂුව - උපස්ථායකයෙකු නොමැතිව ඉතා අසාධ්‍යව රෝගාබාධයෙන් පෙළුණු භික්ෂූන්වහන්සේට බුදුරදුන් පිහිට වූ අයුරු හා ගිලානෝපස්ථානය පිළිබඳ දහම් දෙසීම ඇතුළත් කථා පුවත ලියා තිබීම

(ලකුණු 03යි)

(iii)
- බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අයුරු උදාහරණ කථා පුවත් අනුසාරයෙන් නූතනයට ගැළපීම
- සුනීත සැඬොල් පුත්‍රයා, දෙව්ලොව උපන් සැඬොල් ස්ත්‍රිය, සෝපාක, හඳවතිකා ඇතින්න, පේසකාර දුව, රජ්ජුමාලා, තිස්ස භික්ෂුව, උදරාබාධයෙන් පෙළුණු භික්ෂුව, බණ ඇසීමට ගොස් ආහාර ලැබූ තැනැත්තා
- කායික මානසික වශයෙන් අසරණ බවට පත්වූවන්ගේ මනස ප්‍රකෘති ස්වභාවයට පත් කිරීමට කටයුතු කරන අයුරු
- විවිධාකාර සිතුම් පැතුම් ඇති පුද්ගලයන්ගේ මනස වටහා ගැනීම හා උපකාර කරන අයුරු
- සිත සැනසීමට අදාළව ප්‍රායෝගිකව කටයුතු කිරීම හා එහි අගය
- මෙම කරුණු ඇසුරෙන් පිළිතුරු සකස් වීම (ලකුණු 05යි)

**03.** (i)
- නියමකන්දේ විද්‍යාස්ථානය
- මල්වතු-අස්ගිරි උභය විහාරස්ථ විද්‍යාස්ථාන
- ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරස්ථ විද්‍යාස්ථානය
- පැල්මඩුල්ල රජමහා විහාරය හා පොත්ගුල් විහාර විද්‍යාස්ථානය (ලකුණු 02යි)

(ii)
- 18 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ශාසනික තත්ත්වය අන්ත පරිහානියක පැවතීම
- මිෂනාරී ව්‍යාපාර නිසා බෞද්ධයන් අන්‍ය ආගම් වැළඳ ගැනීම
- භික්ෂු විනය කර්මයකට උපසම්පදා භික්ෂූන් වහන්සේලා සිව්නමක් වත් සොයා ගැනීමට නොහැකි වීම
- ගණින්නාන්සේලා දක්වා භික්ෂු සමාජය පරිහානියට පත්වීම
- භික්ෂු අධ්‍යාපනය ඉතා අවම මට්ටමක පැවතීම

(ඉහත කරුණු ඇසුරෙන් පැහැදිලි කිරීමක් සිදුකොට ඇත්නම් සුදුසු ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 03යි)

(iii)
- පළමුව සඟරජ සාමණේරයන් වහන්සේ ලෙව්කේ දිශාව වෙතින් හා පල්කුඹුරේ අත්ථදස්සි හිමි වෙතින් බාලාවතාරයේ නාම කාණ්ඩය ඉගෙනීම
- ඒ ඇසුරෙන් ධර්මය හා විනය මැනවින් ඉගෙනීම
- තමා උගත් ධර්මය හා විනය අනෙකුත් භික්ෂූන් වහන්සේලා වෙත ලබා දීම හා මේ හේතුවෙන් බොහෝ කුල දරුවන් සසුන්ගත වීම
- සිල්වත් සමාගම පිහිටුවා ගැනීම
- උපසම්පදාව නැවත වරක් නගා සිටුවීමට ක්‍රියා කිරීම
- වර්ෂ 1753 ඇසළ පුරපසළොස්වක් පොහෝ දින (ජූනි 15) මහනුවර මල්වතු මහා විහාරයේ විසුංගාම සීමාවේ දී ප්‍රථම උපසම්පදා විනය කර්මය සිදු කිරීම
- වර්තමාන ශ්‍යාමෝපාලි මහානිකායේ සමාරම්භක අවස්ථාව සිදු විය
- සරණංකර මාහිමියන් සංඝරාජ ධුරයෙන් පිදුම් ලැබීම
- ''උඩගු නොව මහණ, උඩගු නොව මහණ, උඩගු නොව මහණ'' යන්න තෙවරක් තල්පතක සටහන් කොට තබා ගැනීම

- ග්‍රන්ථකරණයෙහි නියැලීම, විද්‍යාපීඨ, ශාස්ත්‍රශාලා ආරම්භ කිරීම, විද්වත් ගිහි පැවිදි ශිෂ්‍ය පරපුරක් බිහි කිරීම, පැරණි පොත්පත් ලියන්නන් ලවා පිටපත් කරවීම
  (ඉහත කරුණු සනාථ කරමින් අදාළ උදාහරණ දක්වමින් ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න.) **(ලකුණු 05යි)**

**04.** (i) ශාස්තෲන් වහන්සේ නැති ශාසනය පාලනය වන්නේ අඩමසකට හෝ මසකට වරක් භික්ෂූන් වහන්සේලා පොහොය සීමාවට රැස්ව කරන විනය දේශන සංඝකර්මයෙන් බවයි. **(ලකුණු 02යි)**

(ii) අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයෝ සතර පොහොයට එක් තැනකට රැස්ව දහම් දෙසති. මිනිස්සු එය ඇසීමට යති. එබැවින්, බිම්බිසාර රජු බුදුරදුන් වෙත ගොස් භික්ෂූන්ට ද සතර පොහොයට රැස්වන්නට අනුදැනීම යහපත් බව සැලකර සිටීම පිළිබඳ විස්තර කිරීම **(ලකුණු 03යි)**

(iii)
- පුබ්බකරණ සහ පුබ්බකිච්චවලට අදාළ කටයුතු ඉටු කිරීම
- උපසපන් භික්ෂූන් තුන් සිවුරෙන් සැරසී පොහොය සීමාවට රැස්වීම
- බුද්ධ ප්‍රතිමා වහන්සේට නමස්කාර කොට ඇවැත් දෙසා ගැනීම
- තෙරුවන් නැමදීම හා උපෝසථ කර්මය සිදු කිරීම **(ලකුණු 05යි)**

## III කොටස

**05.** (i) පුඤ්ඤං චෙ පුරිසො කයිරා - කයිරාථෙතං පුනප්පුනං
තම්හි ඡන්දං කයිරාථ - සුඛො පුඤ්ඤස්ස උච්චයෝ **(ලකුණු 02යි)**

(ii) එහි අර්ථය :-
ඉදින් කිසියම් පුද්ගලයෙකු පින් කරන විට එය නැවත නැවත කළ යුතුය. ඒ පිනටම කැමැත්ත ඇති කර ගත යුතුය. පින් වැඩි වීම සැපයක් වන බැවිනි. **(ලකුණු 03යි)**

(iii)
- ''උදබින්දු නිපාතෙන උදකුම්භෝපිපූරතී''යනාදී ගාථාවට අනුව ''දිය බිඳෙන් බිඳ වැටී දිය කළයක් පිරෙන්නා සේ පාපය ටික ටික නමුත් එක්ව පාපියා පිරී යන්නේ ය.......''
- වාණිජෝව භයං මග්ගං ... යන ගාථාවට අනුව කුඩා වෙළඳ කණ්ඩායමක් රැගෙන වෙළඳාමේ යන මහා ධනවත් වෙළෙන්දෙක් බියකරු මාර්ගයක් මග හැර යන්නා සේ ද ජීවත් වන්නට කැමති අයෙක් වස විසෙන් ප්‍රවේශම් වන්නා සේ ද පාපයෙන් වැළකිය යුතුය.
- යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති............
  සුඛුමො රජො පටිවාතංව ඛිත්තෝ............
  ''උඩු සුළඟට දමන ලද දූවිල්ලක් පෙරලා තමන් වෙත එන්නා සේ''අහිංසක නිරපරාදී යමෙක් පිරිසිදු පුද්ගලයෙකුට දිවේශ කරත් නම් හිංසා කරත් නම් එය තමාටම ඵලවිපාක දෙන්නේ ය.
- එම පාප කර්මය සිදුකළ නැතැත්තාට සැඟවීමට තැනක් මිහිපිට නැත. අහසේ හෝ මුහුදේ හෝ පර්වත ගුහාවක හෝ සැඟවී සිටිය ද ඉන් ආරක්ෂා විය නොහැකි ය.
- කාන්තාවක විසින් ආහාර සඳහා යමක් බදිමින් සිටි අවස්ථාවේ තෙල් බඳුනකින් නැගුණු ගිනිදැල්ලකින් වහළය ගිනිගනියි. අහසට නැගුණු ගිනිදැල්ලට හසු වී මේ අවස්ථාවේ අහසින් ගිය කපුටකු මිය යාමේ සිද්ධිය
- මුහුදේ ගිලෙන්න ගිය නැවක සිටි කාන්තාවක මුහුදට ඇමීම
- ''භද්‍රොපි පස්සති පාපං''
- ''මාප්පමඤ්ඤෙථ පාපස්ස''
- අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී
- ''අත්තාභං උපමං කත්වා''
- ''අත්තානං උපමං කත්වා ... යනාදී පද වර්ණනා හා නිදාන කථා ද නිදසුන් ලෙස පෙන්වා දී ඇති අවස්ථාවල දී සමස්තය බලා ලකුණු පිරිනමන්න. **(ලකුණු 05යි)**

**06.** (i) යමක් අනිත්‍ය නම් එය දුක ය. යමක් දුක නම් එය ආත්ම නොවේ. (ලකුණු 02යි)

(ii) රූප යැයි කියන ශරීරයත් වේදනා යැයි කියන දැනෙන දෙයත් සංඥා යැයි කියන යමක් හඳුනා ගැනීමට ඇති ශක්තියත් සංඛාර යැයි කියන සිතිවිලිත් විඤ්ඤාණ යැයි කියන සිතීමේ හැකියාවත් එකට එකතු වූ විට මම යැයි සම්මතයක් ඇති වේ. මේ එකතුවට ධර්මයේ දී පවසන්නේ පංචස්කන්ධය යනුවෙනි.
(ඉහත කරුණු ඇසුරෙන් පිළිතුර සකස් වී ඇත්නම් සුදුසු ලකුණු ලබා දෙන්න.) (ලකුණු 03යි)

(iii) සබ්බේ සංඛාරා අනිච්චාති - සියලු සංස්කාරයෝ අනිත්‍යය යැයි කියා ද,
සබ්බේ සංඛාරා දුක්ඛාති - සියලු සංස්කාරයෝ දුක්ඛ යැයි කියා ද,
සබ්බේ ධම්මා අනත්තාති - සියලු ධර්මයෝ අනාත්ම යැයි කියා ද,
ආදි ලෙස විස්තර කොට තිබිය යුතු වේ. (ලකුණු 05යි)

**07.** (i) ''රුප්පත්තීති රූපං'' සීත උෂ්ණ ආදියෙන් වෙනස් වීම (ලකුණු 02යි)

(ii)
- කම්ම, චිත්ත, ඍතු, ආහාර
- ආහාරය යනු කබලිංකාර ආහාරය යි. කැබලි කොට ගනු ලබන ආහාරය යි. කුසගිනි උපදින විට ශාරීරික ඕජාව මතු වී එයි. ආහාර ගත්විට අභ්‍යන්තර හා බාහිර ඕජා දෙක එකතු වී ශරීරයට දිරවා ගනී. එතැන් සිට රූප උපදවයි. (ලකුණු 03යි)

(iii)
- උපචය, සන්තති, ජරතා, අනිච්චතා
- කර්මා දී හේතු නිසා රූපයන්ගේ ප්‍රථම හට ගැනීම උපචය නම් වේ.
- ක්ෂණයක් ක්ෂණයක් පාසා නැසෙමින් නැවත රූප හටගනිමින් රූප පරම්පරාව පැවතීගෙන යාම සන්තති නම් වේ.
- රූපයන්ගේ දිරීම ජරතා නම් වේ.
- රූපයන්ගේ බිඳීම අනිච්චතා නම් වේ.

සෑම පුද්ගලයෙකුම සෑම අවස්ථාවකම මෙම ලක්ෂණ හතරට යටත් වන බව පැහැදිලි කර තිබීම අවශ්‍ය වේ. (ලකුණු 05යි)

* * *